# ජීවිතයේ විශේෂ අවස්ථා

## 1. ගැබ්ගැනීම

- කාන්තාවක් ගැබ්ගෙන මවක්වීමෙන් පසුව ඇයට කැමති ආහාර පාන සම්පාදනය කිරීම ඇගේ පවුලේ සහ අසල්වාසීන්ගේ ද යුතුකමක් ලෙස සලකයි. එකල මවට ඇතිවන අහාර පිළිබඳ කැමැත්ත ‘දොළදුක’ ලෙස හඳුන්වයි.
- භික්ෂූන් වහන්සේලා වඩම්මවා පිරිත් දේශනා කරවා ගැනීම චාරිත්‍රයකි. එහිදී මව තමන්ටත් කුසේ සිටින දරුවාටත් වශයෙන් දෙවරක් පංචසීලය සමාදන්වීම ද චාරිත්‍රයකි.
- භික්ෂූන් වහන්සේලා සෙත් පිරිත් සමග අංගුලිමාල පිරිත සජ්ඣායනා කිරීම අනිවාර්යයෙන් සිදු කරයි. ඒ අනුව ආශිර්වාද ගන්වනලද පිරිත් පැන් සහ පිරිත් නූල් ආරක්ෂාව පිණිස ලබා දෙයි.

- ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් ජනයා ද දෙවියන් වහන්සේට ආශීර්වාද ඉල්ලා යාඥා කරති. භාර වීම හා දෙවියන් වෙත පවරා ආසිරි ගන්වන ලද ශුද්ධ ජලය පානය කරති.
- පූජක තැන විසින් ආලෙලූයා සෙනසුරාදා දින විශේෂ යාඥා කිරීමෙන් ජලය ආසිරි ගන්වයි.
- හින්දු අයියර් (ස්වාමි) මන්ත්‍රයක් දේශනා කිරීමෙන් ජලයට ආශීර්වාද ගන්වයි.
- මුස්ලිම් ජනයා මක්කමෙ පිහිටි Sum Sum ළිඳෙන් ගන්නා ජලය විශේෂයෙන් ආශිර්වාද පැන් ලෙස භාවිතා කරයි.
- ආගමික විශ්වාස අනුව ආශිර්වාද ගැන්වීම හා එයට අයත් අභිචාර හෝ වත් පිළිවෙත් තම තමන්ගේ සංස්කෘතික සීමාවන්හි ඉටු කරයි.

# දරු උපත

- අලුත උපදින දරුවාගේ උපන් වේලාව අනුව හඳහන සකස් කරනු ලබයි. ජ්‍යොතිෂමය වූ කාරණාවක් ලෙස එය කරනු ලබයි.
- දරුවෙකුගේ ජීවිතයේ අනාගතය තීරණය කරන හෙවත් පුරෝකථනය කේන්දරයට කළ හැකිය යන විශ්වාසයෙන් පිළිගනී.
- ඉපදීමෙන් මාස දෙකකට පසු කොණ්ඩය කපයි.
- මව්කිරිවලට අමතරව පළමුව ඝන ආහාර දීමේ උත්සවය යනු එම ආහාරවල පළමු පෝෂණයයි. රන්කිරි කටගෑම නමින් පවත් වන උත්සවය කි.
- අකුරු කියවීමේ උත්සවය හෝඩිය මුලින්ම කියවන දිනය යි. ජ්‍යොතිෂමය දින හා කාල නියමය අනුව හින්දු සරස්වතී දේවිය හෝ ඝණදෙවියන් පිදීමෙන් ඉටු කරන උත්සවය කි.
- මෙම සියලු ක්‍රියාකාරකම් දරුවාගේ කේන්දරයට අනුව තීරණය කරන ලද සුබ වේලාවන්හිදී සිදු කෙරේ.

- සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ දරුවෙකුට නම් තැබීම සිදු කරන්නේ හඳහන අනුව ගැලපෙන අක්ෂර හඳුනා ගැනීමෙනි. එපමණක් නොව ඝන ශාස්ත්‍රය අනුව නිවැරදි සුභ ඝනයක නමක් තැබීම ද සිරිතකි. එහිදී පරම්පරා ආදී විශ්වාස මිස විශේෂ බෞද්ධාගමික බලපෑම් නැත.
- දරුවෙකු නම් කිරීම සාමාන්‍යයෙන් කිතුනු සංස්කෘතියේ බව්තීස්ම උත්සවය හරහා සිදුවේ. වාසගම සහ සාන්තුවරයෙකුගේ නමක් සහිත නමක් දැමීම ද සිරිතකි.
- බව්තීස්ම කිරීම සඳහා ඒ ඒ නිකායයන් අනුගමනය කරන චාරිත්‍ර යම්ලෙසකින් එකිනෙකට වෙනස් වේ.
- බිහිකළ දෙමාපියන්ට අමතරව 'මඥ්ඥා' 'පඥ්ඥා' ලෙසින් දෙදෙනෙකු අම්මා හා තාත්තා ලෙස පල්ලියේ ලියාපදිංචි කරනු ලබයි.
- කටන (සුන්නත් කිරීම) නමින් ලිංගික අවයවවල (පෙරසම)  චර්මච්ඡේදනය කිරීම මුස්ලිම් ආගමික චාරිත්‍රයක් ලෙස ලාංකේය සංස්කෘතියෙහි ද ක්‍රියාත්මක වේ.
- උපතින් දින හතක් ඇතුළත, අලුත උපන් බිළිඳාට නමක් ලබා දී, හිසකෙස් කපා ජලස්නානය කරවයි.
- නාමකරන - දින (30) කට පසු හිසකෙස් ඉතිරි කිරීම, නම ලබා දීම, තෙල් පහන් දැල්වීම හා නැහැවීම යනාදිය හින්දු ආගමික චාරිත්‍ර වශයෙන් ඉටු කෙරේ.

# වැඩිවිය පැමිණීම

- සිංහල බෞද්ධ සමාජ සම්ප්‍රදායට අනුව චාරිත්‍රානුකූලව ස්නානය කිරීම, තෑගි දීම සහ වැඩිවිය පැමිණීමට වැඩිමහල්ලන් විසින් උපදෙස් දීම සහ ගෞරවනීය කාන්තාවක් ලෙස සමාජගත කිරීම. මෙහිදී ද ජ්‍යොතිෂමය වශයෙන් අනුගමනය කරන ශුභ හෝරාවන් හා ඵලාපල ආදී කාරනාවන් ද වේ.
- ශ්‍රී ලාංකේය හින්දු හා ක්‍රිස්තියානි සංස්කෘතීන්හි ද මේවා යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වේ. එහෙත් එය මූලික ආගමික විශ්වාසයක් ලෙස නොව මහා සංස්කෘතියේ ආභාසයෙන් ඇතැමුන් අනුගමනය කරයි.
- මුස්ලිම් ජනසමජයෙහි කාන්තාවන් වැඩිවිය පත්වීමේ අවස්ථාවට කිසිදු විශේෂ ඉස්මතු කිරීමක් ලබා නොදෙන බව කියැවේ.

# කසාදය

- අතීත සම්ප්‍රදාය අනුව සමාජ වාර්ගික-කුල නීති, පොරොන්දම් යටතේ මනාලිය හා මනාලයා නම් කරනු ලබන්නේ පවුල්වල දෙමව්පියන් හෝ වැඩිහිටියන් විසිනි.
- විධිමත් විවාහ සහ ආදර විවාහ යන් දෙයාකාරයම විය.
- පෝරුව උත්සවයක් යනු සාම්ප්‍රදායික සිංහල විවාහ උත්සවයකි.
- මුදු හුවමාරු කර ගැනීමේ සිට ආශීර්වාද සහ වෙනත් චාරිත්‍ර සියල්ලම සිදුවන්නේ මනාලිය හා මනාලයා පෝරුවා මත සිටගෙන සිටින විටය.
- මනාලිය විසින් පිරිනමන දෑවැද්ද මෙරට අතීතයේ සිට පැවත එන්නකි.
- ශ්‍රී ලංකාවේ පුරාණ කාල පරිච්ඡේදය විසින් පිළිගත් එක්තරා ආකාරයක බහු පුරුෂ විවාහයක් විය. (එකගෙයි කෑම)
- ආවාහ-විවාහ මෙන්ම භින්න විවාහය ද මෙහි ක්‍රියාත්මක වේ. උඩරට විවාහ නීතිය හා රෝම-ලන්දේසි විවාහ නීති අනුව සිංහල ජනසමාජය විවාහ කටයුතු කරයි.

- හින්දු සම්ප්‍රදායට අනුව, මනාලිය හා මනාලයා සාමාන්‍යයෙන් 7 වතාවක් ගින්න වටා ඇවිදිමින් ශුද්ධ ස්තෝත්‍ර ගායනා කරති. එය සමුරාම ආගමික වතාවතකි.
- කුලය පිළිබඳ විශේෂ අවධානයක් ඇත. දෑවැද්ද සහ ජ්‍යොතිෂමය විශ්වාස ආදී ඇතැම් කාරණා හා විශ්වාස හින්දු සහ සිංහල බෞද්ධයන්ට සමාන ය.
- ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි විවාහයන් බටහිර විවාහයන්ට වඩා වෙනස් නොවේ. මෙම යුවළ විවාහ වන්නේ පල්ලියේදීය.
- දෑවැද්ද, පරම්පරාව, කුලය වැනි කාරණා ඇතැම් විට මහා සමාජයේ ආභාසයෙන් ඇතමුන් විශ්වාස කරන බව දැකිය හැකිය. එහෙත් ආගමික වශයෙන් පූජක සම්බන්ධය ඇතිව පල්ලියේ විවාහය ලියාපදිංචිවීම බොහෝ සෙයින් අනුගමනය කරයි.

- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ විවාහ චාරිත්‍ර - මැලේ ප්‍රජාව සාමාන්‍යයෙන් මැලේසියානු හා ඉන්දුනීසියානු චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරයි.
- බෝරා සහ මේමන් ප්‍රජාවන් ඉන්දියානු සහ පකිස්ථාන චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරයි.
- මුස්ලිම් විවාහ චාරිත්‍ර ඉහත සියල්ලටම වඩා සැලකිය යුතු ලෙස වෙනස් ය.
- වැඩිහිටියන් විසින් නම් කරන ලද යුවළක් වීම සහ වර්ගය, කුලය හෝ පරම්පරාව හා ගෝත්‍ර පදනම් කරගත් සාම්ප්‍රදායික උත්සවයකි.
- සාමාන්‍යයෙන් මනාලයා විසින් දෙන පදෑවැද්ද පිළිබඳව තත් සමාජයෙහි සාකච්ඡා වෙයි. නමුත් සමහර අවස්ථාවලදී මනාලිය දෑවැද්ද දිය යුතුයැයි පිළිගන්නා අවස්ථාවන් ද වේ. දෑවැද්දේදී රත්තරන් හා නිවාස හෝ බිත්ත පදිංචිය සිදු වේ.
- සමස්තයක් ලෙස මෙරට සියලු ජන කණ්ඩායම් තමන්ගේ පාරම්පරික විශ්වාසයන්හි ඇතැම් දේ අදටත් අනුගමනය කරන අතර විවාහ ප්‍රිය සම්භාෂණ වැනි අංග හා ඒවායෙහි ස්වභාවය එකිනෙකට සම-විසමතා සහිතව ක්‍රියාත්මක වේ.

# මරණය සහ අවමංගල්‍ය චාරිත්‍ර

- පූජ්‍ය පක්ෂයේ දායකත්වය ඇතිව ආගමික උත්සවය (පාංශුකූලය) මතක වස්ත්‍ර පූජාව
- අවමංගල්‍ය උත්සවයෙන් පසු මල බත සකස් කිරීම
- 7 වන දින ධර්ම දේශනය හා දානය පිළිගැන්වීම ආදිය
- සමහරු ජ්‍යොතිෂ ශාස්ත්‍රයට අනුව අවමංගල්‍ය කටයුතු සුබ වේලාවක සංවිධානය කරති. පුරාණ කාලයේ මිනී පෙට්ටිය භාවිතා කර නොමැත. සුදු රෙද්දක් ඔතා මළ සිරුර වනාන්තරයේ තබා ඇත.
- මියගිය අය භූමදානය හෝ ආදාහනය කිරීම. ආදාහනයෙන් පසුව අළු එකතු කොට සොහොන් ගෙවල් තැනීම පූජ්‍ය හා ප්‍රභූන් සඳහා විය.

- කතොලික හා ක්‍රිස්තියානි ධර්මය තුළ මරණය මැවුම්කරු දෙවියන්ගේ ශාපයකි. අවමංගල්‍ය චාරිත්‍ර යනු පූජකයන් විසින් නිවසේ හෝ පල්ලියේ පවත්වනු ලබන අතර නැවත දිනෙක අවසන් විනිශ්චය සඳහා නැගිටීමට පහසුකම් සැලසීමට දේහය භූමදාන කරනු ලැබේ. පල්ලිය විසින් ලබා දෙන බිමක භූමදානය හෝ පොදු සොහොනක භූමදානය කිරීම චාරිත්‍රය යි.
- මුස්ලිම්වරු ද මළවුන් භූමදාන කරති, මළ සිරුර දිනකට වඩා තබා නොගනිති. බොහෝවිට IANA විග්‍රහය අනුව කටයුතු කරයි.
- ෂරියා (ඉස්ලාමීය ආගමික නීතිය) ශරීරය භූමදාන කිරීමට පෙර ජලයෙන් සේදීම, ශරීරය සුදු රෙදිවලින් (කාෆන්) එතීම චාරිත්‍රය යි. මිනී පෙට්ටියක් කිසිසේත් භාවිතා නොකරන අතර ආගමික දේවස්ථානය විසින් සම්පාදනය කරන කඳ මගින් රැගෙන යයි. ඉමාම් විසින් අදාළ යාඥාවන් කරනු ලබයි. නැවත නැගිටීම පහසු කිරීම සඳහා ලෑලි අවකාශ සහිතව මක්කම දෙසට පුහුණු සිටින සේ දේහය වළලනු ලැබේ.
- ශරීරය ආදාහනය කිරීම තහනම්ය. භූමදානයෙන් පසුව ශෝක කාලය (ඉඩාදය) ගතකරන කාලය වශයෙන් අනුගමනය කරන චාරිත්‍ර ද වේ.
- සමහරු තෙල් පහන් දල්වා අවමංගල්‍යයෙන් පසු අල් කුර්ආනය කියවති.

- පුරාණ කාලයේ හින්දු ජනයා මරණයෙදී තට්ටුවක් (පාද) භාවිතා කළහ. නමුත් දැන් ශ්‍රී ලාංකික හින්දු භක්තිකයන් මිනී පෙට්ටිය භාවිතා කරයි.
- අයියර් හෝ ස්වාමි විසින් පවත්වන ලද ආගමික කටයුතු අනුව ආගමික චාරිත‍ෘ සිද්ධ වේ.
- තාත්තා වෙනුවෙන් වැඩිමහල් පුතාගේ ද බාල පුතා අම්මා වෙනුවෙන් කොණ්ඩය කපා අදාළ චාරිත්‍ර ඉටුකරයි.
- ආදාහනය කිරීමෙන් දින පහකට පසු අළු මුහුදේ හෝ ගඟේ පා කරනු ලබයි. වර්තමානයේ දී ආදාහන කටයුතු හා එයට අදාළ අනෙකුත් ආගමික චාරිත්‍ර මිශ්‍ර සංස්කෘතිකාංග සහිතව සිදු වේ.

# සාරාංශය

- පිළිගත් බහු සංස්කෘතික, බහු ආගමික සමාජයක් වන ලාංකේය සමාජයේ චාරිත්‍ර ඉතාම පුළුල් වූවකි. එය එකම ආගමික හෝ වාර්ගික ජනකණ්ඩායමකදී පළාත් හෝ සම්ප්‍රදාය අනුව විවිධාකාර චාරිත්‍ර විධි අනුගමනය කරයි.
- කෙසේ වෙතත් උපතේ සිට මරණය දක්වාත් මරණින් පසුවත් කෙරෙන විවිධ ආගමික හෝ සමාජ චාරිත්‍ර වේ. තවද පුද්ගල හෝ සමාජ ජීවිතයේ විවිධ කාරණාවන් අනුව පිළිගත් චාරිත්‍ර ද බොහෝ වෙති. ඇතැම්විට කාල දේශානුරූප වෙනස්කම් හා සංස්කෘතික වශයෙන් සම්මිශ්‍රණයවීම් දක්නට ලැබේ.
- සමස්තයක් ලෙස ඒ ඒ ජන කණ්ඩායම් තමන්ගේ අනන්‍යතා සහිතව ඉටුකරන චාරිත්‍ර මත වෙනස් වන අතරම ආදේශ, අනුගතවීම් හා අනුකරණමය වශයෙන් පවත්වන චාරිත්‍ර ද බොහෝ සෙයින් දක්නට ලැබේ.

# පරිශීලනයට


- සිංහල බෞද්ධ චාරිත්‍ර හා පිළිවෙත්, එල්. කේ. විතානාච්චි ආදීන්, ගොඩගේ සහ සහෝදරයෝ, 2002
- ආවාහ-විවාහ චාරිත්‍ර, එල්ලාවල අරියවිමල හිමි, 2018 (294.34441 ARI)
- මුස්ලිම් විවාහ නීති පිලිබඳ විවරණයක්, ෂාරුක්, ඒ. ජේ. එම්. සහ කාසිම්, ජේ. එම්. මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1997
- යොනකයා හා බිරියන් තසර දෙනා (ශ්‍රී ලංකාවේ මුස්ලිම් සිරිත්-විරිත ටිකක්), එම්. එස්. එම්. අයුබ්, සුරාහ්, 2014
- කතොලික සමාජ දර්ශනය, 1, 2, 3, අර්නස්ට් පොරුතොට පියතුමා, එස් ගොඩගේ සහ සහෝදරයෝ, 2011
- ශ්‍රී ලංකාවේ අවමංගල්‍යය චාරිත්‍ර, පී. එම්. සේනාරත්න, එම්. ඩී. ගුනසේන සහ සමාගම, 2000